# සිහින තේරීම

මේ ලිපි පෙළෙහි අරමුණ ඇතැම් අයට වටහාගැනීමට නො හැකිවීම කණගාටුවට කරුණකි. විශේෂයෙන් ම තම පුතුන්ගේ නමින් මේ ලිපි සම්බන්ධයෙන් අදහස් පළකරන වැඩිහිටියන්ට මේ අදාළ ය. අප මෙහි දී වෑයම්කරන්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය මත පදනම් වී විවිධ ක්ෂෙත්‍රවල ප්‍රවාද ගොඩනැගීම ය. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි යමක් ගැන ඇත්තේ එකම අර්ථකථනයක් පමණක් යැයි යමකු සිතන්නේ නම් ඒ තදබල වරදක් පමණක් නොව ඊනියා යථාර්ථයකට යටවීමක් ද වෙයි. යථාර්ථයක් ඇත්තේ ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මිස සිංහල බෞද්ධ සංස්කෘතියෙහි නො වෙයි. පටිච්ච සමුප්පාදය ගැන වුව ද විවිධ අර්ථකථන පමණක් නොව විවිධ සූත්‍ර දේශනා ද සිංහල බෞද්ධ සංස්කෘතියෙහි දක්නට ඇත.

බුදුන් වහන්සේ ධර්මය දේශනාකෙළේ සංයුක්තව හා සාපේක්ෂව ය. ඒ ඒ අයගේ අවශ්‍යතාව අනුව උන්වහන්සේ ධර්මය දේශනා කළහ. මෙයින් උන්වහන්සේ විවිධ ධර්ම දේශනාකළ බවක් නොහැඟෙයි. උන්වහන්සේ දෙසූ දහමෙහි නිවන, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ආදිය සංකල්ප නොවන බැවින් ඒ සාපේක්ෂ හෝ පරමාර්ථ හෝ නො වෙයි. සාපේක්ෂ වූ දහම් සාපේක්ෂව දෙසීම බුදුන්වහන්සේගේ පිළිවෙත විය. උන්වහන්සේ පරමාර්ථ වශයෙන් දෙසූ දහමක් නැත. එහෙත් ඇතැම් ථෙරවාදී බෞද්ධයන්ගේ අර්ථකථනවලට අනුව පරමාර්ථ වූ ධර්ම වෙයි. මේ පිළිබඳ අපි දැනටමත් ඇතැම් දේ සඳහන්කර ඇත්තෙමු. පටිච්ච සමුපාපදය වුව ද විවිධව සාපේක්ෂ ව දේශනාකෙරී ඇත්තේ එබැවින් ය. නාමරූප පච්චයා විඥාන යනුවෙන් පමණක් සඳහන් වන තැන් මෙන් ම නාමරූප පච්චයා විඥාන, විඥාන පච්චයා නාමරූප යනුවෙන් ඒ දෙකම එකට සඳහන්වන තැන් ද ථෙරවාදී සූත්‍රවල දැකගත හැකි ය. එහෙත් එයින් කියැවෙන්නේ නාම රූප හා විඥාන යනු දෙකම එකක් බව නො වේ. ඒ දෙකම එකක් නම් නාම රූප පච්චයා විඥාන යනුවෙන් පමණක් සඳහන් තැන්හි කියැවෙන්නේ යමක් නිසා එයම ඇතිවන්නේ ය යන්න ද? මෙහි දී බුදුන්වහන්සේ අතින් ප්‍රතික්ෂෙප වන්නේ රේඛීය චින්තනයකි. නාම රූප පච්චයා විඥාන, විඥාන පච්චයා නාම රූප යන්න චක්‍රීය චින්තනයට නිදර්ශනයක් මිස නාම රූප හා විඥාන එකක් ලෙස ගැනීමට මඟ සලසන්නක් නො වෙයි.

කය යන්නට පවා විවිධ අර්ථකථන දිය හැකි ය. කාම ලෝකයේ සත්තවයනට ඇති කය රූප ලෝකයේ සත්ත්වයනට නැත. කාම ලෝකයේ පමණක් නොව රූප ලෝකයේ ද සත්ත්වයන් හා ද්‍රව්‍ය ද වෙයි. අප උත්සාහ ගන්නේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි කියැවෙන සංකල්ප ඔස්සේ විවිධ ක්ෂෙත්‍රවල ප්‍රවාද ගොඩනැගීම ය. දැනටමත් අපි අපේ ඇසට නොපෙනෙන ක්වොන්ටම් අංශු සඳහා රූප ලෝකයේ අංශු යැයි කියමු. අපට පෙනෙන ඉන්ද්‍රිය ගෝචර ද්‍රව්‍යවලට අපි කාමලෝකයේ ද්‍රව්‍ය යැයි කියමු. අරූප තලවල බ්‍රහ්මයන්ට කයක් ඇත් ද? එසේ කයක් ඇතැයි කියමින් ඒ සියුම් යැයි කියන්නේ කිනම් අර්ථයකින් ද? ඒ සියුම් කය සෑදී ඇත්තේ ඉන්ද්‍රිය ගෝචර ද්‍රව්‍යවලින් ද, එසේත් නැත්නම් ඉලෙක්ට්‍රෝන හෝ නියුට්‍රෝන වායුවකින් ද? අද ඉලෙක්ට්‍රෝන වායු විසින් ඇතිකෙරෙන පීඩනයෙන් රඳාසිටින ශ්වේත වාමන (white dwarfs) තාරකා හා නියුටෝන වායුවලින් ඇතිකෙරෙන පීඩනයෙන් රඳාසිටින නියුට්‍රෝන තාරකා (neutron stars) ගැන බටහිර තාරකා විද්‍යාවෙහි සඳහන් වෙයි.

කයක් සියුම් යැයි කීම තේරුමක් නැති කතාවක් වෙයි. ඒ සියුම් බව යන්නෙන් අදහස්වන්නේ කුමක්දැයි ඊනියා සියුම්කමක් ගැන කතාකරන්නන්ට කියහැකි නො වෙයි. සියුම් කය ඇසට නො පෙනෙන්නේ ද? ඒ සෑදී ඇත්තේ ද්‍රව්‍යයෙන් ද, විකිරණයෙන් ද වෙනත් දෙයකින් ද? මෙය බටහිර විද්‍යාවක සංකල්ප යොදාගැනීමක් නො වෙයි. බටහිර නොවන සංකල්ප යොදාගෙන හෝ ඊනියා සියුම්කය යන්න තේරුම්කර දෙන්නේ කෙසේ ද? කය යනු ඒ ඒ අයගේ ඉන්ද්‍රියන්ට සාපේක්ෂ සංකල්පයකි. අද අප කතාකරන්නේ මිනිසුන්ට සාපේක්ෂ සංකල්පවලින් ය. ඒ සංකල්පවලට අනුව සිත මිස කය නැති බ්‍රහ්ම ලෝකයෙහි බ්‍රහ්මයන්ට කයක් නැත. අද ඉන්නා තමන්ගේ නමින් ලිපියක් ලියාගත නොහැකිව දරුවන් ඒ සඳහා බිලිකරන අය වැනි කොන්දක් නැති ඊනියා උගතුන්ට මෙන් නොව ලෝවැඩසඟරා කතුවරයාට උසස් අන්තර්ඥානයක් තිබූ බවට සැකයක් තිබිය නො හැකි ය.

© Prof. Nalin De Silva

අප සිත ගැන කතාකරන්නේ නිවන් දැකීමට නො වේ. අප දරුවන්ට උගන්වන්නේ, ඇතැම් විට බෞද්ධයන් තම දරුවන් ක්‍රිස්තියානි සම්භවයක් ඇති පාසල්වලට යවන්නේ ඔවුන්ට නිවන් දැක්කවීමට නො වෙයි. අපේ එකම අරමුණ නිවන් සාක්ෂාත්කිරීම නො වෙයි. අප කළ යුතු වන්නේ සිත ගැන සිත සිතා සිටීම නොව සිතින් නිදහස්වීම යැයි යමකු පවසන්නේ හොඳ සිහියකින් නොවිය යුතු ය. සිතෙන් නිදහස්වීමට හැක්කේ සිතක් තිබෙ නම් ය. එහෙත් සිතක් තිබෙ ද? සිතක් තිබෙ යැයි ගත් වහාම ඒ ආත්මවාදී වෙයි. සිතින් නිදහස්වීමට නම් ගිහි පැවිදි සැම වහා වහා මගඵල පසක් කළ යුතු යැයි කියන විට එහි උච්ඡේදවාදයක් වෙයි. උච්චෙදවාදීන්ට නිවන් පසක් කරගත හැක්කේ පළමුව උච්ඡේදවාදය අත්හැරීමෙන් ය.

ඇතැම් බෞද්ධයනට අවශ්‍යවන්නේ සිත ගැන සිතීම බටහිර විද්‍යාඥයන්ට පවරා තමන් නිවන්මග ගැන පමණක් නැති සිතක් යොමුකරන බව කීම ය. එහෙත් ඔවුහු එසේ නො කරති. ඔවුන් සිත ගැන නම් නොසිතනු ඇත. එයට හේතුව එවැනි කරුණු ඔවුන් බටහිර විද්‍යාඥයන්ට පවරා තිබීම ය. ඒ අතර ඔවුහු නිවන් මග පසෙක ලා වස්තු රැස්කරති. ක්‍රිස්තියානි සංස්කෘතියක ජීවත්වෙති. ඒ අතර නිවන්මග ගැන ද කියති. පන්සල් යති. පන්සිල් සමාදම් වෙති. මේ ඕල්කට් බෞද්ධයෝ වෙති. ඔවුන්ට යම් මානසික ප්‍රශ්නයක් ඇති වූ විට ඔවුහු බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි බිහි වූ බටහිර මනෝ විශ්ලේකයන් සොයා යති. අභිධර්මයෙහි චිත්ත චෛතසික විභාගය කටපාඩම් කරගත් පමණින් යමකුට මානසික ප්‍රශ්නවලට විසඳුම් සොයාගත නො හැකිය. ඕල්කට් බෞද්ධයන්ට සිංහල බෞද්ධ මනෝවිශ්ලේෂණයක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවක් නැත. අපට එසේ නො වෙයි. අපට සිංහල බෞද්ධ මනෝවිශ්ලේෂණයක් මෙන් ම සිංහල බෞද්ධ විශ්වවෙදයක් (cosmology) ද ගොඩනගාගැනීමට අවශ්‍ය වෙයි.

එපමණක් නොව සිංහල බෞද්ධ ජීව විද්‍යාවක් ආදී වශයෙන් වෙනත් ක්ෂෙත්‍රවල ද සිංහල බෞද්ධ දැනුම් පද්ධතීන් ගොඩනගාගැනීමේ අවශ්‍යතාව වෙයි. අප කටයුතු කරන්නේ ඒ අරමුණින් ය. සිංහල බෞද්ධ දේශපාලන විද්‍යාවක් ගොඩනගාගැනීම වෙනුවට චක්කවත්ති සීහනාද සූත්‍රයට හෝ වෙනත් සූත්‍රයකට හෝ ඇඟිල්ල දික්කර පෙන්නා සිංහල බෞද්ධ දේශපාලන විද්‍යාව එහි ඇතැයි කීමට අපි බලාපොරොත්තු නො වෙමු. අපි එවැනි සූත්‍ර මත පදනම් ව සිංහල බෞද්ධ දේශපාලන විද්‍යාවක් ගොඩනගාගැනීමට උත්සාහ දරමු. සිත ගැන කතා නොකර සිත පිළිබඳ ප්‍රවාද නිර්මාණය නොකර උච්ඡේදවාදීව සිත නිරුද්ධකිරීමට යෑමෙන් නිවන් අවබෝධ නොවනවා පමණක් නො වෙයි. බටහිර මනෝවිශ්ලේෂණයේ ආධිපත්‍යයෙන් ගැලවීමට ද අපට කිසිදාක ඉඩක් නො ලැබෙයි.

සිත ගැන අපේ ප්‍රවාද ගොඩනැගීමට වෑයම්කරන අපි යටි සිත හා උඩුසිත යනුවෙන් කොටස් දෙකකට සිත බෙදූවෙමු. එසේ ම අවශ්‍ය නම් එවැනි බෙදීමක් වෙනුවට එකක් ලෙස සිත ගැනීමට ද හැකියැයි අප කියා ඇත. මේ හුදු නිර්මාණ පමණක් බව අප කිසිවිටෙක අමතක නොකළ යුතු ය. බටහිර ප්‍රවාද ද නිර්මාණ බවත් කවුරු කවුරුත් ප්‍රවාද නිර්මාණයකරන්නේ අනිත්‍ය දුක්ඛ අනාත්ම අනවබෝධය නිසා බවත් අවධාරණය කළ යුතු ය. මේ ප්‍රවාද අප ගොඩනගන්නේ යම් සීමාවක සංගතව ලෝකයක් නිර්මාණයකරගැනීම සඳහා බව ද අමතක නොකළ යුතු ය.

අපි දැන් නැවතත් සිහිනවලට යමු. සිහින පිළිබඳ ව ද අප ගොඩනගන්නේ ද ප්‍රවාදයකි. එය සිංහල බෞද්ධ සංස්කෘතියෙහි සිංහල බෞද්ධ චින්තනයක් පදනම්කරගනිමින් ගොඩනැගීමට අපි උත්සාහ කරමු. සිහිනවලට අර්ථකථන සැපයීම කළ හැක්කේ කෙසේ ද? බටහිරයෝ සිහින ඔස්සේ පුද්ගලයන් හඳුනාගැනීමට උත්සාහකරති. ඔවුන්ගේ පදනමෙහි වන්නේ සිහිනවලට වාස්තවික අර්ථකථන තිබෙය යන්න ය. එහෙත් ප්‍රශ්නය ම වන්නේ සිහිනවලට එසේ වාස්තවික අර්ථකථන දිය හැකි ද යන්න ය.

මිනිසුන්ගේ මනස් මිනිසුන්ගේ සිරුරුවලට ද වඩා එකිනෙකින් වෙනස් වෙයි. බටහිරයෝ මිනිස් සිරුරේ ඇතිවන ව්‍යාධිවලට වාස්තවික යැයි කියන ප්‍රතිකාර කිරීමට උත්සාහ කරති. එහි දී ඔවුන්ගේ මිනුම් දඬු එකම වෙයි. ඖෂධ නියම කෙරෙන්නේ මිලි ලිටර් වලින් ය. මිලි ලීටරය කාටත් පොදු ඊනියා වාස්තවික මිනුමකි. මේ වාස්තවිකත්වය ඔවුහු මනෝවිශ්ලේෂණයට ද ගෙන එති. එහෙත් ප්‍රශ්නය මිනිස් මනසට එවැනි ඊනියා වාස්තවික කතන්දර යොදාගත හැකි ද යන්න ය.

© Prof. Nalin De Silva

කොසොල් රජු දුටු සිහින තේරුම් කිරීමට කොසොල් රජු ගැන දැන සිටිය යුතු යැයි අපි සිතමු. එසේ නොමැතිව කොසොල් රජු දුටු සිහිනවලින් කොසොල් රජු තේරුම්ගැනීමට වෑයම්කරන්නේ නම් එහි ප්‍රශ්නයක් වෙයි. එවැනි ප්‍රත්නයක දී සියළු මිනිසුන් දකින ඊනියා වාස්තවික සිහින ඇතැයි උපකල්පනය කෙරෙයි. බටහිරයන් විශ්ලේෂණයකරන්නේ මිනිසා දකින සිහින මිස එක් මිනිසකු දකින සිහින නො වෙයි. කොසොල් රජු දුටු සිහින ඉන්පසු මිනිසුන් කී දෙනකු දැක ඇතැයි ඔබ සිතන්නේ ද?

මනස වෙනත් කිසිම ඉන්ද්‍රියකට වඩා ඒ ඒ පුද්ගලයාට සාපේක්ෂ වෙයි. එවැනි විටෙක ඊනියා මිනිසකු දකින සිහිනවලට වඩා ඇත්තේ ඒ ඒ මිනිසා දකින සිහින ය. එබැවින් යම් මිනිසකු දැක ඇති සිහිනයක් විශ්ලේෂණයකිරීමේ දී ඒ මිනිසා ගැන යමක් දැනසිටීම වැදගත් වෙයි. මේ සාපේක්ෂත්වයෙන් තොරව සිහින තේරීම පොදු මිනිසකු ඇතැයි උපකල්පනය කරමින් ඒ පොදු මිනිසාගේ ඊනියා වාස්තවික සිහින වෙනත් මිනිසුන්ට ආදේශකිරීමට වෑයම්කිරීමක් වෙයි. අප කළ යුතු වන්නේ ඊනියා පොදු මිනිසකුගේ සිත ගැන කතාකිරීම නොව ඒ ඒ මිනිසාගේ සිත ගැන කතා කිරීම ය.

කොසොල් රජු දුටු සිහින තේරීමේ දී කොසොල් රජු ගැන දැන සිටීම වැදගත්වන්නේ එබැවින් ය. කොසොල් රජු හැරෙන්නට වෙනත් අයකු  ඒ සිහින දකී යැයි සිතිය නො හැකි ය. රජකු වශයෙන් අනාගතයේ දී රජ්‍යයට කුමක් විය හැකි ද යන ප්‍රශ්නය රජුගේ සිතෙහි නිතර ඇති වූ ප්‍රශ්නයක් විය හැකි ය. අනෙක් අතට ඔහු භාරතයේ බුද්ධකාලයේ විසූ රජ කෙනකු බව ද අමතක නොකළ යුතු ය. බටහිර යුරෝපයේ වැඩවසම් යුගයේ රජකු ලෝකයේ අනාගතය ගැන කල්පනා කෙළේ නම් කිනම් සිහින දැකීමට ඉඩ තිබුණි ද? සිහින තේරීම ඊනියා නවකතා විචාරකයන්ගේ සෙල්ලමක් නොවන බව පැහැදිලි විය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva